සියලුම හිමිකම් ඇවිරිණි.
*All Rights Reserved*



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## පෙරදිග සංගීතය - I

**12 ශ්‍රේණිය** | **කාලය පැය 01 යි.**

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

(01) පූර්වාංගවාදී රාග ගායනය සඳහා සුදුසු ගායන සමය වන්නේ,
  (1) මධ්‍යම රාත්‍රී 12 උදෑසන 07 දක්වා  (2) මධ්‍යම රාත්‍රී 12 මධ්‍යහන 12 දක්වා
  (3) මධ්‍යහන 12 මධ්‍යම රාත්‍රී 12 දක්වා  (4) මධ්‍යහන 12 රාත්‍රී 07 දක්වා
  (5) මධ්‍යම රාත්‍රී 12 සිට උදෑසන 03 දක්වා (........)

(02) භාව පූර්ණ ශාස්ත්‍රීය ගායනයක් ඉදිරිපත් කිරීම සඳහා ගායකයෙකු තුළ තිබිය යුතු සුවිශේෂී ගුණයකි.
  (1) හුස්ම පාලනයෙන් යුතුව මුදා හැරීම.  (2) දීර්ඝ ස්වසනය
  (3) තම ශ්‍රැතියේ සිට මන්ද්‍ර මධ්‍ය උච්ච සප්තක හොඳින් ඇසුරු කිරීමේ හැකියාව.
  (4) හුස්ම රඳවාගැනීම  (5) නිවැරදි ආශ්වාස ප්‍රශ්වාසය (........)

(03) මීන්ඩ් ශිල්පාංගය ප්‍රධාන කොට ගැයෙන වැයෙන පූර්වාංගවාදී හා උත්තරාංගවාදී රාග යුගලයක් වන්නේ,
  (1) ආශාවරී දේශ්  (2) භීමපලා ශ්‍රී දේශ්  (3) දේශ් හමීර්
  (4) බිහාග් දේශ්  (5) තිලක්කාමෝද් බිහාග් (........)

(04) බටහිර සම්ප්‍රදායට අනුව වයලීනය සුසර කරනුයේ,
  (1) ම ස ප රි  (2) ප රි ධ ග  (3) ප ස ප ස
  (4) ස ප ස ප  (5) ප ස ප රි (........)

(05) ස රි ග ම රිග ම ප | ගම පධ මප ධනි | පධ නිස ධනි සරි | යන තානාලංකාරය,
  (1) සරල තානයකි.  (2) ශුද්ධ තානයකි.  (3) අලංකාරික තානයකි.
  (4) සපට් තානයකි.  (5) මිශ්‍ර තානයකි. (........)

(06) ධ්‍රැපද් ගායනය සඳහා පහත නිවැරදි කරුණ වන්නේ,
  (1) ගීතය මැද මධ්‍ය ආලාප කරයි.  (2) තානාලංකාර අවසානයේ ගයයි.
  (3) තාල වාදනයට පක්වාජය භාවිතා කරයි.  (4) ගීතය මුල, මැද ආලාප කරයි.
  (5) තබ්ලාව තාල වාදනයට යොදාගනියි. (........)

(07) සොකරි නාට්‍යයේ එන චරිතයකි.
  (1) මුදලි  (2) වෙදරාළ  (3) සෙල්ලම් ළමා
  (4) නෛංචි අක්කා  (5) අණ බෙරකරු (........)

(08) ප ප | රි රි රි | රි රි | නි ග ස යනුවෙන් ආරම්භ වෙන්නේ,
  (1) තාගෙස්ශ්‍රී රාගයේ සර්ගම්  (2) තිලත්තාමෝද් රාගයේ සර්ගම්
  (3) ජය ජයවන්ති රාගයේ සර්ගම්  (4) බාගෙස්ශ්‍රී රාගයේ මධ්‍යලය ගීතයයි.
  (5) ජය ජයවන්ති රාගයේ මධ්‍යලය ගීතයයි. (........)

(09) ගතියෙන් හා මිතියෙන් වෙනස් තාල පද දෙක කුමක්ද?
  (1) එක්තාල් චෞතාල්  (2) ත්‍රිතාල් පංජාබ්  (3) දීප්චන්දි ධමාර්
  (4) තීලවඩා ත්‍රිතාල්  (5) රූපක් දීප්චන්දි (........)

www.artsapi.lk

(10) හින්දුස්ථානි සංගීතයට පමණක් අයත් ගායනා විශේෂයකි.

(1) කීර්තනාම් (2) පදම් (3) තිලානා
(4) තරාණා (5) වර්ණම් (........)

- **අංක 11 - 20 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(11) ආලාප ගායනයෙන් ඇති ප්‍රයෝජනයක් ලියන්න.

..........................................................................................

(12) ක්වාලම් නමැති උපකරණයෙන් වාදනය කරන හින්දුස්ථානි සංගීතයට අයත් භාණ්ඩය කුමක්ද?

..........................................................................................

(13) කර්ණාට තිලානා ගායන ශෛලිය හා සමාන හින්දුස්ථානි ගායන ශෛලිය කුමක්ද?

..........................................................................................

(14) වයලින් පවුල නම් කරන්න.

..........................................................................................

(15) භාරතීය සංගීතයේ කොටස් දෙක කුමක්ද?

..........................................................................................

(16) ගමරි | ගපධනි | ස̇නිධ | පමගග යන ස්වර පේළිය පංචම භාවයෙන් ලියන්න.

..........................................................................................

(17) ගායනයේ දැක්වෙන ගුණයක් ලියන්න.

..........................................................................................

(18) දඹදෙණි යුගයේ රචිත ග්‍රන්ථයක් නම් කරන්න.

..........................................................................................

(19) පෙරදිග හා අපරදිග සංගීත ක්‍රමවල දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ දෙක මොනවාද?

..........................................................................................

(20) අනාඝාතාත්මක ගැමි ගී වල දක්නට ලැබෙන විශේෂතා 02 ක් ලියන්න.

..........................................................................................

(21) ශාන්තිකර්ම අතුරින් උඩරට ශාන්තිකර්ම වලට අයත් වන්නේ,

(1) සන්නියකුම (2) පුනාමඩු (3) කිරිමඩු
(4) ගම්මඩු (5) මල්යහන් කවි (........)

(22) නූතන සරල ගී නිර්මාණය සඳහා වැදි ගී පදනම් කරගත් අවස්ථාවකි.

(1) රුක් අත්තන මල මුදුනේ (2) මාරම්බරී (3) නංගිට බැඳපු මල් වියනයි.
(4) පුන් සඳ රෑට (5) හෝපලු වනපෙත (........)

(23) අනාඝාතාත්මක මෙහෙ ගීයකට අයත් ගීතයකි.

(1) මාල් මල් මල් (2) නිල් ගනෙලු (3) ඉපල් පිටින් ගහන අච්ච
(4) සුරතට රැගෙන පන්දම (5) අම්ම පල්ලා බඹරුන් අත වරද නැති (........)

(24) එක්තරා සංගීත පද්ධතියක ස්වර සාධනය "නෙම්, බැරං, ගුලු, දදා, නිමා, පෙලොග" ආදී වශයෙන් ස්වර නම් කරයි. එම සංගීත පද්ධතිය කුමක්ද?

(1) බටහිර සංගීත පද්ධතිය (2) භාරතීය සංගීත පද්ධතිය
(3) චීන සංගීත පද්ධතිය (4) ඉස්ලාමික් සංගීත පද්ධතිය
(5) ගැමිලැන් සංගීත පද්ධතිය (........)

www.artsapi.lk

(25) ශ්‍රී ලංකාවේ සංගීත ක්ෂේත්‍රය තුළ ව්‍යවහාරික සංගීතාංගයක් ලෙස වර්ග නොවන ගී විශේෂය කුමක්ද?

(1) චිත්‍රපට ගී (2) සරල ගී (3) බ්‍යාල් ගී

(4) ග්‍රැමෆෝන් ගී (5) ටෙලිනාට්‍යගී (.......)

- **අංක 26 - 30 දක්වා වූ ප්‍රශ්නවල හිස්තැන් පුරවා ලියන්න.**

(26) ............................................................. සහ ස්වරිත වශයෙන් වේද ගායනා නාද ස්ථාන තුනකට ගායනා කළ බව පැරණි පොත පතෙහි සඳහන් වේ.

(27) කෝලම් නාට්‍ය රඟ දැක්වීම සඳහා එළිමහන් රංග භූමියක් යොදා ගනී. එය ................................................... ලෙස හැඳින්වේ.

(28) මහා පැරකුම්බා රජතුමන් විසින් ඉදිකරන ලද ................................................ සංගීත නැටුම් සඳහා විවෘත වූ අතර ................................................................ නමින් පවත්වාගෙන ගිය සංගීත බලකායක්ද වූ බව චූල වංශයේ සඳහන් වේ.

(29) ශ්‍රී ලංකාවේ ශාන්තිකර්ම උඩරට, පහතරට හා සබරගමු වශයෙන් තෙවැදෑරුම්ය. සබරගමු ශාන්තිකර්ම වලදී ................................................................ ප්‍රධාන මඩුව වන අතර පහතරට ශාන්තිකර්ම වලදී................................................................ ප්‍රධාන මඩුව වේ.

(30) භීමපලාශ්‍රී රාගයේ ජාතිය ............................................................ වන අතර එම ජාතියටම අයත්වන ශුද්ධ ස්වර වලින් සමන්විත රාගයක් ලෙස ................................................................ හැඳින්විය හැකිය.

- **අංක 31 - 40 දක්වා වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

(31) ජයජයවන්ති රාගයේ මේල ස්වර ලියන්න.

................................................................................................................................................

(32) රි, ප වාදි සංවාදි වන රාග 2 ක් ලියන්න.

................................................................................................................................................

(33) ලංකාවේ ප්‍රථම නූර්තිය කුමක්ද?

................................................................................................................................................

(34) එහි නිර්මාතෘවරයා කවුද?

................................................................................................................................................

(35) උඩරට කවිකාරමඩුව ආශ්‍රිත සංගීත ආයතන 2 ක් නම් කරන්න.

................................................................................................................................................

(36) කර්නාටක සංගීතයේ මේල සංඛ්‍යාව කීයද?

................................................................................................................................................

(37) මාත්‍රා 12 බැගින් යෙදෙන හින්දුස්ථානි තාල 2 ක් නම් කරන්න.

................................................................................................................................................

(38) අනාඝාතාත්මක මෙහෙ ගීයක් නම් කරන්න.

................................................................................................................................................

(39) ''රිමප'' ස්වර සංගතිය නිතර යොදාගැනෙන රාග 2 ක් නම් කරන්න.

................................................................................................................................................

(40) දේශීය තිත් පද්ධතිය අනුව තනි තිතේ සහ දෙතිතේ ප්‍රභේද සංඛ්‍යාව පිළිවෙලින් ලියන්න.

................................................................................................................................................

www.artsapi.lk

(41) පද්‍ය හා ගද්‍ය කොටස් ඇතුලත් ගැමි ගායනා විශේෂයකි.

(1) පතල් ගී (2) පාරු ගී (3) ගැල් ගී

(4) ටීකා (5) පැල් ගී (........)

(42) එකස්වර (Melody), බහුස්වර (Hormony) යන සංකල්ප දෙකට වඩාත් ම ගැලපෙන සංගීත සම්ප්‍රදායන් දෙක කුමක්ද?

(1) පෙරදිග හා කර්ණාටක (2) හින්දුස්ථානි හා කර්ණාටක

(3) හින්දුස්ථානි සහ අපරදිග (4) අපරදිග හා පෙරදිග

(5) කර්ණාටක හා දේශීය (........)

(43) මුවමුත්තාලතා, හෝපලුවනපෙත යන ගීත දෙකෙහි නාද මාලා සඳහා පදනම් වූ රාග දෙක පිළිවෙලින්,

(1) බාගෙස්ශ්‍රී හා පීලු (2) මාල්කෞතිස් හා පීලු (3) මාල්කෞතිස් හා බාගෞර ශ්‍රී

(4) පිලු හා බාගෞර ශ්‍රී (5) ශිවරංජනී හා පීලු (........)

(44) ධ්‍රැපද් ගායනය සඳහා යොදාගනු ලබන තාලය වන්නේ,

(1) එක්තාල් (2) චෞතාල් (3) ත්‍රිතාල්

(4) තිලවඩා (5) ධමාර් (........)

(45) මකාමත් සංගීතය ලෙසින් හඳුන්වනු ලබන්නේ,

(1) ඉන්දුනීසා සංගීතයයි. (2) කර්ණාටක සංගීතයයි. (3) ඉස්ලාමික් සංගීතයයි.

(4) චීන සංගීතයයි. (5) ගැමිලෑන් සංගීතයයි. (........)

(46) කර්ණාටක පද්ධතියට අයත් සුෂිර වාද්‍ය භාණ්ඩයකි.

(1) නාදස්වරම් (2) ඝටම් (3) බටනලාව

(4) ෂෙනායි (5) සර්පිනාව (........)

(47) වයලීනයේ සූක්ෂම සුසර කිරීමට ඇජෙස්ටර්ස් නම් ඇණයක් යොදා ගනු ලබන අතර සිතාරයේ යෙදා ගනු ලබන්නේ,

(1) ගට්ටා (2) තත් ස්වර (3) Tuning Key

(4) පික් (5) මන්කා (........)

(48) බාල මුරලි ක්‍රිෂ්ණා සුප්‍රසිද්ධ වන්නේ,

(1) වර්ණම් නිර්මාණයටයි. (2) තාරාණා නිර්මාණයටයි.

(3) ඛ්‍යාල් නිර්මාණයටයි. (4) තිලාණා නිර්මාණයටයි.

(5) පදම් නිර්මාණයටයි. (........)

(49) අනාසාතාත්මක ගැමි ගීයක් ලෙස දැක්විය හැක්කේ,

(1) පෙරකාලේ කරපු අකුසල් (2) පැහැසරණිය මිණි පැමිණිය

(3) ඉන්ද්‍ර දිසාවට ඉඹුල් විමානෙට (4) බෝගම්බර අපි නෙලුමට යනකොට

(5) මේ කාගේදෝ කමතා (........)

(50) රි රි රි | ස ස | රි රි රි | ස ස ස

රි රි රි | ස ස ස | රි රි රි | ස ආදී වශයෙන් ස්වර යෙදෙන ගායන විශේෂය වන්නේ,

(1) ශාන්තිකර්ම ගී (2) වැදි ගී (3) ටීකා ගී

(4) සරල ගී (5) වර්ණම් (........)

(2 x 50 = 100)

www.artsapi.lk

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## පෙරදිග සංගීතය - II

12 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- I කොටසින් ප්‍රශ්න දෙකකටද, II කොටසින් එක් ප්‍රශ්නයකටද, III කොටසින් ප්‍රශ්න දෙකකට ද වනසේ ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න..

### I කොටස

01. (i) ඔබ විෂයය නිර්දේශයේ බමාජ් මේලගත රාගයක ස්ථායි අන්තරා කොටස් ගිත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 08)

(ii) එම රාගයට ගැලපෙන තානාලංකාර 4 ක් නිර්මාණය කරන්න. (ල. 08)

(iii) එම රාගයට අයත් විශේෂ ස්වර සංගති 2 ක් ලියන්න. (ල. 04)

02. (i) බාගෙස්ශ්‍රී රාගයේ

| | | | |
|---|---|---|---|
| 1. මේලය | 2. ජාතිය | 3. ආරෝහණ | 4. අවරෝහණ |
| 5. මුඛ්‍යාංගය | 6. වාදි | 7. සංවාදි | 8. ගානසමය |

පිළිවෙලින් ලියන්න. (ල. 08)

(ii) එම රාගයට සුදුසු ස්වර 30 කට නොඅඩු ආලාප ඛණ්ඩ 2 ක් නිර්මාණය කරන්න. (ල. 08)

(iii) එම රාගයෙහි විශේෂ ලක්ෂණ 02 ක් ලියන්න. (ල. 04)

03. (i) ඔබ නිර්දේශ ගත රාගයක සර්ගමයක් ප්‍රස්තාර කරන්න. (ල. 08)

(ii) එම රාගයට අයත් ස්වර අභ්‍යාසයක් ආරෝහණ අවරෝහණ වශයෙන් නිර්මාණය කරන්න.(ල. 08)

(iii) එම රාගයේ විශේෂ ස්වර සංගති 2 ක් ලියන්න. (ල. 04)

### II කොටස

04. හින්දුස්ථානි ගායන වාදන වලදී ආලාප හ ානානාලංකාර දෙවර්ගය ඉතා වැදගත් වේ.

(i) ආලාප යන්න නිර්වචනය කරමින් ආලාප වර්ග 5 ක් නම් කර ඒවා පිළිබඳව විස්තර කරන්න.(ල. 06)

(ii) තාලාංකාර යනු නිර්වචනය කරමින් තාලාංකාර 5 ක් නම් කර විස්තර කරන්න. (ල. 06)

(iii) පහත සඳහන් රාගධාරී සංගීතයේ ශිල්ප ක්‍රම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(a) මීන්ඩ් (b) ගමක් (c) ඛන් (d) මූර්ති (ල. 08)

05. "දියරැල්ල හඬ නගා සිය අසිරි පෙන්වයි."

(i) ඉහත සඳහන් ගී පාදය සුදුසු තාලයකට අනුව පද ප්‍රස්තාර කරන්න. (ල. 06)

(ii) එම පද ප්‍රස්තාරයට අනුකූලව තාලය (හින්දුස්ථානි) නම් කර යේකාවෙන් දෙගුණය ලියා දක්වනන. (ල. 06)

(iii) එම හින්දුස්ථානි තාලයට අනුරූප තිත නම් කරන්න. (ල. 02)

(iv) එම පද ප්‍රස්තාරයට උචිත තනුවක් යොදා ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 06)

## III කොටස

06. (i) පහත සඳහන් ගායනා ශෛලීන් අතර සම විෂමකම් දක්වන්න.

(a) ධ්‍රැපද් ධමාර් (ල. 04)

(b) තරාණා තිල්ලානා (ල. 04)

(ii) උත්තර භාරතීය සහ දක්ෂිණ භාරතීය සංගීත පද්ධති වල සම විෂමතා දක්වන්න. (ල. 08)

(iii) උත්තර භාරතීය සහ දක්ෂිණ භාරතීය පද්ධතීන්ගේ ගායන ශෛලීන් 4 බැගින් දක්වන්න.(ල. 04)

07. (i) ආඝාතාත්මක අනාඝාතාත්මක වශයෙන් දේශීය ගී දෙවර්ගයක් බිහිවීමට හේතු සාධක දක්වමින් එම ගී දෙවර්ගය විස්තර කරන්න. (ල. 07)

(ii) අනාඝාතාත්මක මෙහෙ ගියක මුල් පද දෙක ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 07)

(iii) උඩරට ශාන්තිකර්ම ගීයක ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 06)

08. (i) උතුරු ඉන්දියානු සංගීතය පදනම් කොට නිර්මාණය වී ඇති සිංහල සරල ශාස්ත්‍රීය ගීයක් පිළිබඳ රසවින්දනාත්මක විමසුමක් ඉදිරිපත් කරන්න. (ල. 06)

(ii) සරල ගීතයක ආකෘතිය ලියා දක්වා ඒවා කෙටියෙන් හඳුන්වන්න. (ල. 06)

(iii) රාගධාරී සංගීතය ඇසුරු කරගත් ගීත 4 ක් ලියා දක්වා ගීතය සඳහා පදනම් වූ රාගය සහ ගායකයා පිළිවෙලින් ලියා දක්වන්න. (ල. 08)

www.artsapi.lk